**බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම**
**2012 අගෝස්තු මස 21 වන දින පෙ.ව 9.30ට**

# න්‍යාය පත්‍රය

I. **සභාපතිතුමාගේ නිවේදන**

II. **ලිපි ලේඛන පිළිගැන්වීම**

III. **කාරක සභා වාර්තා පිළිගැන්විම**

IV. **පෙත්සම්**

V. **ප්‍රශ්න**

01. **ගරු සරත් පතිරණ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :**

(ප්‍ර/V (1)12/19)

අ. මොරටුව මහ නගර සභාවේ නගරාධිපතිතුමා ඇතුළුව නාගරික මන්ත්‍රීවරුන් දොළොස් දෙනෙකු 2012 ජූලි 14 සිට 21 දක්වා ඉන්දුනීසියාවේ සංචාරයකට සහභාගි වී ඇති බව ඔබතුමා දන්නේද?

ආ. i. මෙම මහජන නියෝජිත පිරිස එම සංචාරයට සහභාගී වී ඇත්තේ කිනම් කටයුත්තක් සඳහාද ?

ii. එය සංවිධාන කරනු ලැබුයේ කිනම් ආයතනයක් විසින්ද? යන්න, මෙම ගරු සභාවට පැහැදිලි කරන්නේද ?

ඇ. i. මෙම සංචාරය සඳහා මුදල් ප්‍රතිපාදන සපයා ගෙන ඇත්තේ කෙසේද ?

ii. එම මුදල් ප්‍රමාණය කොපමණද ?

ඈ. මෙම සංචාරය සඳහා මොරටුව මහ නගර සභාවේ මුදල් වියදම් කර ඇත්නම් එම මුදල් ලබා ගැනීමේදී මහ නගර සභා ආඥා පනතේ 28 වැනි වගන්ති ප්‍රකාරව කටයුතු කර තිබේද ?

ඉ. මෙම සංචාරය සඳහා නිවාඩු අනුමත කර ගැනිමේදී මු.ක්‍ර.අ.01/2010/01 දරන චක්‍රලේඛය අනුව කටයුතු කර නොමැති බව ඔබතුමා පිළිගන්නේද?

ඊ. මෙම සංචාරයට අදාළව සිදුවී ඇති අක්‍රමිකතා සහ මූල්‍ය වංචා පිළිබඳව 2012.07.20 වැනි දින මොරටුව මහ නගර සභා මන්ත්‍රී නිශාන්ත ප්‍රදිනාන්ද්‍ර මහතා ඔබතුමා වෙත එවා ඇති ලිපියට අනුව ඔබතුමා ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද?

**02. ගරු ඊ සිරිකමල් පිලීෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට :**

**(ප්‍ර/V (1)12/20)**

අ. 2012 වසරේ පළමු වැනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරිමේදී මෙම පළාත් සභාවට අයත් පාසැල් වල බලධාරීන් විසින් මුදල් අය කළ බවට පැමිණිලි ලැබී තිබේද?

ආ. i. එසේ පැමිණිලි ලැබුණි නම් එම පාසැල් සංඛ්‍යාව කොපමණද ?
ii. ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද ?

ඇ. එම පැමිණිලි පිළිබඳව පරීක්ෂණයක් කර තිබේද?

ඈ. එසේ කරන ලද පරීක්ෂණයේදී මුදල් ලබා ගත් බවට හෙලිවූ පාසැල් මොනවාද ?

ඉ. නැවත එම මුදල් දෙමාපියන් වෙත ගෙවන ලද පාසැල් මොනවාද?

ඊ. i. මේ පිළිබඳව විදුහල්පතිවරුන් වෙත අවවාද ලිපි නිකුත් කර තිබේද ?
ii. තිබේ නම් ඒ කුමන විදුහල්පතිවරුන් වෙතද ?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## IX. සභාවේ කටයුතු I

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

"*අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය*"

## සභාවේ කටයුතු II

**ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට**

යෝජනාව :

" අද දිනට නියමිත න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයය යටතේ දැක්වෙන විෂයය අංක 01 හා 02 හි සඳහන් වැඩ කටයුතු රීති අංක 52 (5), 57 (1), 57 (4) හා 57 (5) හි දැක්වෙන විධිවිධානයන්ගෙන් නිදහස්ව පවත්වා ගෙන යායුතුය. "

# X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

## 01. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :

" වර්තමානයේදී පාසල් වල පවත්නා භෞතික සම්පත් බොහෝ සෙයින් සතුටුදායක මට්ටමක පවතී. එසේම අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයද සතුටුදායක මට්ටමක පවතී. එසේ වුවත් පාසලක විදුහල්පතිවරයෙකු විශ්‍රාම යන විට අළුතින් විදුහල්පතිවරයෙකු පත් කිරීමට කාලයක් ගතවන අවස්ථා බොහෝ ඇති අතර, එවැනි අවස්ථාවලදී වැඩ බැලීමේ පදනම මත විදුහල්පතිවරයෙකු පත් කර පාසල පවත්වා ගෙන යනු ලබයි. එවැනි වැඩබලන විදුහල්පතිවරුන් විදුහල්පති තනතුරේ කොපමණ හොඳින් කටයුතු කලද ඔවුන්ට එම තනතුරේ ස්ථිර වීමට අවස්ථාවක් නොමැත. මෙවැනි තත්වයක් තුළ කොතරම් දියුණු මට්ටමක පැවති පාසලක්වුවත් පහළ මට්ටමකට වැටීමට ලක් විය හැක.

මෙම තත්වය මඟ හැරවීම සඳහා බස්නාහිර පළාත තුළ සුදුසුකම් සහිත ගුරුවරුන් තෝරා පුහුණු කිරීමෙන් හෝ විදුහල්පති විභාග පවත්වා සුදුස්සන් තෝරා ගෙන විදුහල්පති සංචිතයක් ඇති කළ යුතු යැයිද, යම් පාසලක විදුහල්පතිවරයෙකු විශ්‍රාම ලබන විටම ඒ වෙනුවට එම සංචිතයෙන් විදුහල්පතිවරයෙකු පත් කිරීමට පියවර ගත යුතු යැයිද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

**(යෝ/v(01)12/07)**

2012.08.07 දින පැවති සභා රැස්වීමේ
වැඩ කටයුතු හා සම්බන්ධිතයි.

## 02. ගරු අශෝකා ලංකාතිලක මන්ත්‍රීතුමිය :

" රට තුළ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා වත්මන් රජය විවිධ ව්‍යාපෘතින් ක්‍රියාත්මක කරමින් පවතී. " අපි වවමු රට නගමු ", " දිවි නැගුම " හා " පොහොර සහනාධාර ලබාදීම " වැනි ව්‍යාපෘති මඟින් ඉහළ එළවළු හා පළතුරු එලදාවක් ලැබෙමින් පවතී. එලදාව නෙලන කාලයේදී එළවළු හා පළතුරු පහසු මිලකට ලබා ගත හැකි අතර, එම කාලවලදී අතිරික්ත එලදාව නිෂ්ප්‍රයෝජන ලෙස විනාශ වන අවස්ථා දක්නට ඇත. එම තත්ත්වය ගොවීන්ට පාරිභෝගිකයන්ට මෙන්ම රටේ සමස්ත ආර්ථිකයට අහිතකර ලෙස බලපායි. එබැවින් ආහාර භෝග නිෂ්පාදන කල් තබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද සකස් කර ගොවීන් වෙත හඳුන්වා දීමෙන් ගොවීන්ට සිදු වන පාඩුව මඟහැර වීමටත්, පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට නිෂ්පාදන මිලදී ගැනීමට අවස්ථාව සැලසීමටත් පියවර ගත යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

**(යෝ/v(01)12/08)**

## XI. පොදු කටයුතු

**01. ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

යෝජනාව :

**<u>2012 පරිපූරක ඇස්තමේන්තුව - 01</u>**

2012 වර්ෂය සඳහා බස්නාහිර පළාතේ පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු හා කාර්යාල වල පහත සඳහන් අවශ්‍යතාවයන්ට එනම්:

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 31/2011 මඟින් වැඩි කරන ලද විශේෂ දීමනාව හා නව බඳවා ගැනීම් සඳහා පුද්ගලික පඩිනඩි යටතේ ගෙවීම් කිරීමට අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම.

II. ගරු පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ රියදුරු දීමනා හා ඉන්ධන දීමනා ගෙවීම් සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසීම.

III. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා සෞඛ්‍ය අමාත්‍යාංශය යෝජිත නව ගොඩනැඟිලිවල ස්ථාපිත කිරීම සඳහා ගෙවිය යුතු බදු කුලී සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම.

IV. අඩක් නිමකළ පාසැල් ගොඩනැඟිලිවල වැඩ අවසන් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම.

V. පළාත් සභා සංවර්ධන වැඩසටහනේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමට අවශ්‍ය අමතර ප්‍රතිපාදන සැලසිම හා

VI. 2012 මුදල් ප්‍රකාශයේ ආදායම් ඇස්තමේන්තුව සංශෝධනය කිරීම

යන කරුණු වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කළ යුතුව ඇති හෙයින් ඒ සඳහා ඉදිරිපත් කරන ලද 2012 පරිපූරක ඇස්තමේන්තුව - 01 (රු1,434,635,000/=) අනුමත කල යුතුය.

02. **ගරු ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රම සම්පාදන නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප)**

යෝජනාව :

**2012 පරිපූරක ඇස්තමේන්තුව - 01ට අදාළ විසර්ජන ප්‍රඥප්තිය**

2012 වර්ෂයේ පරිපූරක ඇස්තමේන්තුව 01 සඳහා අවශ්‍ය " රුපියල් එකසිය හතළිස් තුන් කෝටි හතළිස් හය ලක්ෂ තිස් පන් දහසක් " (රු1,434,635,000/=) වූ මුදල බස්නාහිර පළාත් සභා අරමුදලින් ගෙවීමටත්, එකී බස්නාහිර පළාත් සභා අරමුදලට ශ්‍රී ලංකා ආණ්ඩුවෙන් ප්‍රදාන වශයෙන් හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල් ගැනීමටත් බලය දෙනු ලබන 2012 අංක ------ දරන විසර්ජන ප්‍රඥප්තිය අනුමත යුතුය.

භාර කළ

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව

2012.08.08
සභා ලේකම් කාර්යාලය (බ.ප)
බස්නාහිර පළාතේ පළාත් සභාව.
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.